"මෙම කොවිඩ්-19 තත්වය ජන මනසට ආතතිය සහ ඉච්ඡාභංගත්වය ඇති වන ලෙස නොව, අනාගතය සම්බන්ධයෙන් ධනාත්මක බලාපොරොත්තු සහ එකිනෙකා අතර සහයෝගය ඇතිවන ලෙස ප්‍රවෘත්ති සහ දැනුවත් කිරීම් ලබාදෙන්න" යනුවෙන් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති නිර්දේශයන්හි සඳහන් වේ.
මෙම නිර්දේශය අවශ්‍ය වන්නේත්, පුද්ගලයින් කොවිඩ්-19 කෙරෙහි අනියත බියක් ඇති කරගැනීම සහ ඒ ඔස්සේ වෛද්‍ය ප්‍රතිකාර නොගෙන සැඟවීමට උත්සාහ කිරීම හේතුවෙනි. අරුණ පුවත්පතෙහි (10/21) පළ වී ඇති, "රැළි පිට රැළි නඟන කොවිඩ් දෙවැනි රැල්ල" වැනි සිරස්තල ඔස්සේ, ආතතියක් සහ ඉච්ඡා භංගත්වයක් මිස ධනාත්මක පණිවුඩයක් ඇති වේ යැයි ඔබ සිතන්නේද?

පුවත්පත් මගින් මෙම වසංගතයේ බරපතල බව සහ අදාළ අධිකාරීන් මගින් ආරක්ෂාව සඳහා ලබාදෙන උපදෙස් සහ රෙගුලාසි පිළිපැදීමේ වැදගත් කම ජනතාව වෙත සන්නිවේදනය කිරීම අවශ්‍ය වන නමුත්, එය කළ යුත්තේ ජනමනස තුළ කොවිඩ්-19 සහ අනාගතය සම්බන්ධව ආතතියක් සහ ඉච්ඡාභංගත්වයක් ඇති නොවන ලෙසින් නොවේද?

මූලාශ්‍ර: [https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...](https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...)

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #Aruna #NewsPapers #Coronavirus**